## ප්‍රශංසා එකතු සුපුවත
## 2018 අප්‍රියෙල් මස 02 වන දින සිට අප්‍රියෙල් මස 08 වන දින දක්වා

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 05 "ශ්‍රද්ධා වීර්ය ...."

ප්‍රශංසාවට හැඳින්වීම :

"ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම් අපගේ දේශනා කිරීම නිරර්ථකය; ඔබගේ ඇදහීමත් නිරර්ථකය. " (1කොරෙන්ති 15:14) ශු.පාවුළු තුමා උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවීමේ අත්දැකීම අපට ප්‍රකාශ කරනුයේ, උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමු නොවුනු පුද්ගලයා ජීවිත වෙනසක්, නවතාවයක්, ජීවනයක් අත්නොදකින කෙනෙකු බවයි. මරණය ජයගෙන ප්‍රථාපවත්ව අප අතර වැඩ වසන උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවීම වරප්‍රසාදයකි. එකමුතුකම තුළ වැඩ වසන ජීවමාන සමිඳාණන් වහන්සේව හමුවීමේ නොනවතින ගමනක යෙදෙන්නට වරප්‍රසාදය ලත් පිබිදුනු කිතුනුවන් ලෙස අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 42 "අහස පොළව අතර රැඳී..."

02. සාංඝික පවුල් දින සුපුවත හරහා ඔබට ලැබුනු වචනය ජීවිතය තුළ අත්දකින්නට හැකිවූ අවස්ථාවන් අත්දැකීම් ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

03. දවසේ සුපුවත :

i ශු.ජොහාන් 20:11-18 පොදුවේ ප්‍රකාශ කරන්න.

ii උත්ථානවූ සමිඳාණන් වහන්සේව මග්දලාවේ මරියාට දර්ශනය වූ මොහොතේ ඇය ඒ අත්දැකීමට මුහුණ දුන් අයුරු ළඟ සිටින දෙදෙනෙකු සමඟ බෙදා ගන්න.

* මග්දලාහි මරියාට එකවරම සමිඳාණන් වහන්සේව හඳුනා ගන්නට නොහැකි වූ අතර, ඔවුන් වහන්සේගේ ඇමතුමෙන් (ජේසුස් වහන්සේ 'මරියා' කියා ඈ ඇමතූ සේක.) ඇගේ ඇස් පහදනු ලැබුවේ උත්ථානවූ සමිඳාණන් වහන්සේ මෙලොව ජීවිතයෙන් පසු ඇතුළු වූ මහිමයේ තත්ත්වය ප්‍රබලව ප්‍රකාශ කරමිනි. සමිඳාණන් වහන්සේව හඳුනා ගත් මරියා තුළ ඉමහත් ප්‍රීතියක් ඇති වූවාට නම් කිසිම සැකයක් නැත.
* තමන් දුටු උත්ථානවූ සමිඳාණන් වහන්සේ ගැන ශ්‍රාවකයන්ට දන්වන්න යැයි සමිඳාණන් පැවසූ වදන් ශ්‍රාවකයන් වෙත රැගෙන ගියේ උත්ථානවූ සමිඳාණන් වහන්සේ ගැන සාක්ෂි දරමිනි.
* උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවීම විශ්වාසයේ අත්දැකීමකි ;වරප්‍රසාදීක අත්දැකීමකි.
* මග්දලාහි මරියාට උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවීම දක්වා ඇය ආ ජීවිත ගමන පිළිබඳ අපේ අවධානය යොමු කරද්දී අපට පේනවා ඇය පිළිබඳව දේව සැලැස්ම ඉටු වූ අයුරු.
* පව්කාරියක ලෙස ගල් ගසා මරණයට එදා පරිසිවරු, විනයධරයෝ උත්සාහ දරද්දී දේව ප්‍රේමය ඉදිරිපිට සිත් හැරීමකට, ජීවිත වෙනසකට ඇතුළු වූ ඇය උතථානයේ මහිමය ප්‍රථමයෙන් දැකීමේ වරම ලැබීය. එම නිසා උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවීම වරප්‍රසාදීය අත්දැකීමකි.

04. අප දෙසට : සාකච්ඡාව සඳහා (ළඟ සිටින කෙනෙකු සමඟ)

i ඔබ/මම උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවන ඇසුරු කරන කෙනෙකි. උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවීමේ අත්දැකීම ඔබේ/මගේ ජීවිතය තුළ ඇති කරන වෙනස, නවතාවය ගැන බෙදා ගන්න.

ii උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවීමේ අත්දැකීම විශ්වාසයේ අත්දැකීමකි.වරප්‍රසාදික අත්දැකීමකි. වරප්‍රසාදයෙන් පිරෙමින්, විශ්වාසයෙන් යුතුව උත්ථානවූ සමිඳාණන් හමුවීමේ අත්දැකීමට සාක්ෂි දරන්නට ඔබ ගෙන ඇති පියවරයන් බෙදා ගන්න.

05. හෙට දවස පුරා :

උත්ථානවූ සමිඳාණන් වහන්සේව නිතර නිතර හමුවෙන්නට පිපාසයෙන් යුතුව අවදිවීමෙන් සිටිමු.

06. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 70 "කිතුන් වහන්සේ ...."

=====================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 අප්‍රියෙල් මස 09 වන දින සිට අප්‍රියෙල් මස 15 වන දින දක්වා**

**එම්මාවුස් ගමනේදී ප්‍රකාශ වූ උත්ථානයේ සමිඳාණෝ** (ශු.ලූක් 24:15)

01. ප්‍රශංසාව සඳහා යොමුව :

* ගැළවුම්කරුවාණන් ද ජීවනයේ සමිඳාණන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට හද පත්ලෙන්ම මේ මොහොතේ අපගේ වන්දනාව, නමස්කාරය පුද කරමු. මන්ද පාස්කු අභිරහස මගින් ඔවුන් වහන්සේ අප ගළවා ගත් සේක.
* මනුෂ්‍යයන් හැටියට අපට මුහුණ දෙන්නට සිදුවූ අතී භයංකර තත්ත්වයකින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මුළු මිනිස් සංහතිය මුදා ගත් සේක.
* ශුද්ධාත්මයාණෙනි ! වඩිනු මැනව ඔවුන් වහන්සේව අත් දකින්නට අප සිත් ආලෝකමත් කළ මැනව...
* පුබුදු ගී අංක 126 "ශුද්ධාත්මයාණෙනි // වඩිනු මැනවි ශුද්ධාත්මයාණෙනි...."

02. පසුගිය සතියේ අපගේ අත්දැකීම් සාංඝික කර ගනිමු. ( කණ්ඩායම් තුළ හා පොදු වශයෙන්)

03. සතියේ සුපුවත :

(පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨය මුල් කරගෙන එම්මාවුස් නගරයට යමින් සිටි ශ්‍රාවකයන් දෙදෙනාගේ අත්දැකීම කුමක්ද යන්නත්, උත්ථානයේ සමිඳාණන් ප්‍රකාශ වීම පිළිබඳවත් දෙතුන් දෙනෙක් සමග සාකච්චා කරන්න.)

* ශු.ලූක් 24:13-35 (වචනයේ සේවකයා විසින් සැකෙවින් එම්මාවුස් ගමන තුළ සිදුවීම බෙදා ගන්න. කුඩා කණ්ඩායම් තුළ අවශ්‍ය ශු.ලියවිලි පාඨ පමණක් උදව් කර ගන්න.)

04. වචනයේ සේවකයා සඳහා:

i * ධර්මයාණන් මිනිසත් බව ගෙන, මනුෂ්‍යයන් අතරට වැඩම කළේ, මුළු මිනිස් වර්ගයා වෙනුවෙන්ම දැක්වූ කොන්දේසි විරහිත ප්‍රේමය නිසයි. සදාකාලික මරණයෙන් මනුෂ්‍ය වර්ගයා මුදා ස්වර්ගීය සම්පත උරුම කර දීම පිණිසය.

* දූත කාර්යය ආරම්භයේදීම ස්නාවක ජොහාන් තුමා ජේසුස් වහන්සේ කවරෙක්දැයි මුළු ලෝකයාටම හඳුන්වා දුන්නේ මෙසේය.
**"මෙන්න ලෝකයේ පාපය දුරලන දෙවියන් වහන්සේ. දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ "** (ශු.ජොහාන් 1:29)
* ශු.පාවුළු තුමාද මෙසේ පැවසීය. **"උන්වහන්සේ මට ප්‍රේම කර, මා උදෙසා දිවි පිදූ සේක"** යනුයි. (ගලාති 2:20)
* ක්‍රිස්තුන් වහන්සේගේ කායික මරණය මෙසේ උත්ථානයට මග පාදනු ලැබීය.

ii * එම්මාවුස් සිද්ධිය මගින් ක්‍රිස්තුන් වහන්සේ අපට දුන් පොරොන්දුව ස්ථිර කළ සේක. මාගේ නාමයෙන් එකමුතු වන තැන මම වැඩ සිටිමි යි වදාල පරිදි ඔවුන් වහන්සේ මෙම ශ්‍රාවකයන් දෙදෙනා අතරට වැඩම කළ සේක. ඒ මගින් ඔවුන්ගේ කනස්සල්ල පහ විය. සුන් වූ බලාපොරොත්තු නැවත සවිමත් විය. සියල්ල නැති වූවා සේ දැනුනත් සියල්ල නැති වී නැති බව ඔවුන්ට අවබෝධ වූ අයුරු පෙනේ. ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඔවුන් තුළ තිබූ විශ්වාසය යලි පිබිදෙන්නට පටන් ගත්තේ නොසිතූ අයුරිනි. රබ්බි ! ගුරුදේවයිනි! යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි තැබූ මුළු බලාපොරොත්තුව මෝඩ කමක්, නිෂ්ඵල දෙයක් නොවන බව ඔවුන් අත්දැකීමෙන්ම දැන ගත්තේය.

* එසේම ඔවුන්ගේ පෙරැත්ත කිරීම නිසා, රොටී කැඩීමේදී අප සමඟ ගමන් කළ අමුත්තා කවරෙක්දැයි හඳුනා ගත්තේය. එදා එම්මාවුස් නිවසේදී රොටී කැඩීමේ සිද්ධිය දිව්‍ය සත්ප්‍රසාදිය ක්‍රියාවක් සේය. මහ බ්‍රහස්පතින්දා දින ඔවුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට වදාළ දැය, නැවත ස්ථිර කරමින් "මා සිහිවීම පිණිස මෙය සිදු කරන්නැ"යි පැවසූ සේක.

05. අප දෙස :

* අපිදු එදිනෙදා ජීවිතය තුළ විවිධ ආකාරයෙන්, අනපේක්ෂිත සිද්ධි වලට මුහුණ දෙන විට කනස්සල්ල, බිය, අපේක්ෂාවන් බිඳ වැටීම ආදි අසරණකම්වලට මුහුණ දෙන විට සමිඳාණන් අප සමඟ සිටින බව විශ්වාස කරමු. සිදුවන සියල්ල තුළ අපව එතෙර කරන බව විශ්වාසයෙන් අයිති කර ගනිමු. ගැළවීම දානය කරන බව අදහා ගනිමු.
* අපගේ ගමන තුළ ඔවුන් වහන්සේ අප සමඟ ගමන් කරන බව අත්දකින්නට පටන් ගනිමු. ප්‍රේමයේ නාමයෙන් ගැඹුරු එකමුතුකමේ ජීවිතයක් අද අපි පටන් ගනිමු.
* එම්මාවුස් නගරයට යමින් සිටි ශ්‍රාවකයන් දෙදෙනාට උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ හෙළිදරව් වීමට මුල් වූයේ ඔවුන්ගේ හදවත් තුළ තිබූ පරිත්‍යාගශීලී භාවය අපි තරයේ සිතට ගනිමු.

06. අවසාන යැදුම :

* පුබුදු ගී 268 "උසස් කෙරුමට සොයුරු දිවි මග..." ගීතය උදව් කරගනිමින් අවසාන යාච්ඤාවට පිවිසෙන්න.

==================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 අප්‍රියෙල් මස 16 වන දින සිට අප්‍රියෙල් මස 22 වන දින දක්වා**

01. **ප්‍රශංසාවට හැඳින්වීම :**

* පුබුදු ගී අංක 01 'පිය පුත් සුදතුම් සමිඳුට ....
* "එහෙයින්, අන්ධකාරයෙන් ස්වකීය විශ්මපත් ආලෝකයට ඔබ කැඳවාගත් තැනැන්වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දක්වනු පිණිස ඔබ වනාහි තෝරාගත් වංශයක්ද රජකීය පූජක පෙළක්ද ශුද්ධ ජාතියක්ද දෙවියන් වහන්සේ සතු සෙනඟක්ද වන්නහුය." (1 පේදුරු 2:9)
* "ඔබ මා තෝරා ගත්තේ නැත. මම ඔබ තෝරාගෙන පත් කළෙමි." ඔවුන්වහන්සේ අප තෝරාගෙන, කැඳවා ගෙන ඇත. ඒ කුමක් සඳහාද? මොහොතක් අවදිවෙමු.
* පුබුදු ගී අංක 95 "ඔබ තෝරාගත් ඔබගේ රජයේ...."

**02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම**

**03. දවසේ සුපුවත** :

* ශු. ජොහන් 20:24-29 පොදුවේ ප්‍රකාශ කරන්න.
* කුඩා සංඝ ලෙස වෙන්වී නැවත මෙම පාඨය කියවා මේ පිළිබඳව සාංඝික කර ගනිමු.
* ඉන්පසු කුඩා සංඝ කිහිපයක අත්දැකීම් පොදුවේ සාඝික කර ගනිමු.

**04. වචනයේ සේවකයා සඳහා** :

* "ඔවුන්වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක, ඇණ ගසා තිබූ තැන්වල මාගේ ඇඟිල්ල තබා, ඔවුන් වහන්සේගේ ඇළයෙහි මාගේ අත දමා බැලුවොත් මිස, නැත්නම් විශ්වාස නොකරමි." උත්ථානවූ සමිඳාණන් වහන්සේ වන කැළැල් දැරූ සේක. මරණය සමඟ උත්ථානය එකිනෙක අතටත ගනී.

* "ඔබට ශාන්තිය වේවා !" "ඔබේ ඇඟිල්ල මෙහි බහා මාගේ අත් බලන්න. ඔබේ අත දිගු කර මාගේ ඇලයෙහි තබන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්න." අද ද ඔවුන්වහන්සේ ඔබට මට පවසන සේක

* "මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි" අපගේ යාච්ඤාව හා ප්‍රශංසාව එයම විය යුතු නොවන්නේද?

* "ඔබ මා දුටු බැවින් අදහාගත්තෙහිය. නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝය." සමිඳාණෝ මේ පවසන්නේ ඔබ හා මා ගැන නොවේද?

**05. අප දෙසට :**

* විටෙක ඔබ මා තෝමස් තුමා මෙන් ක්‍රියා නොකරන්නේ ද? ළඟ සිටින කෙනෙක් සමඟ බෙදා ගන්න.

* අප පවුල තුළ, අප සංඝය තුළ, අපගේ එදිනෙදා ජීවිත සිද්ධීන් තුළ වැඩ වසන සමිඳාණන් වහන්සේව හමුවීමේ අත්දැකීම කෙබඳුද? බෙදාගන්න.

* ප්‍රශංසා ගමක් ලෙස ඔබේ ගම තුළ, අසල්වාසීන් අතර අසනීප ලෙඩදුක්, වේදනා, අසරණකම් තුළ දී ඒ අය හා එක්ව යාච්ඤාවෙන් ප්‍රශංසාවෙන් සමිඳුන් හමුවන්නට ඔබ පියවර ගන්නවාද? බෙදාගන්න.

* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුව පෞද්ගලිකව පෙනී සිටින්නට සතියේ එක දිනක් වත් වෙන්කර ගන්න.

**06. අවසන් ප්‍රශංසාව** : පුබුදු ගී අංක 221 "ජේසුනී සමිඳේ...."

====================--

**ප්‍රශංසා එකතු සුපුවත**
**2018 අප්‍රියෙල් මස 23 වන දින සිට අප්‍රියෙල් මස 29 වන දින දක්වා**
**'උත්ථානයේ කිතු ආලෝකයට හසු වූ ශු.පාවුළු තුමා '**

01. ආරම්භක ගීය: පුබුදු ගී අංක 334 (නව මුද්‍රණය) 310 (පැරණි මුද්‍රණය)
"ගංගාවෙනි ගළා ගළා බසිනා ...."

02. ප්‍රශංසාවට යොමුව :

* අපි උත්ථානයේ සමයට ඇතුළු වී සිටිමු. දින 40ක චතාරික භාවනාව තුළින් පාස්කු මහයට එළඹ සිටින අප සමිඳුන් එදා සිදුකළ එතෙරවීම සමඟින් අපද අපගේ ජීවිතවල එතෙර වීමට ඇතුළුව සිටිමු.
* පසුගිය සති කිහිප තුළද උත්ථානයෙන් පසු ක්‍රිස්තුන් වන්සේ හමු වූ විවිධ පුද්ගලයන් හා පිරිස් ගැන භාවනා කළෙමු. අපි සැම දෙනම උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ හමුවන , ඒ ප්‍රීතිය අත්දකින අය වන්නෙමු. දහසක් අතුරෙන් එම තත්ත්වය අයිති කර ගැනීමට අප තෝරා ගෙන ඇත. ඒ පිළිබඳව මැවුම්කරුවාණන් වහන්සේට තුති ප්‍රශංසා කරමු.
"දහසක් අතරින් මා තෝරා ගත්තාවූ...." ගීතය සමඟින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.
(කිතුනු ගී 174)

03. සතියේ සුපුවත :

* 1ජොහාන් 4:8 තුළින් "දෙවියන් වහන්සේ යනු ප්‍රේමය" ලෙසින් හඳුන්වා දෙනු ලබයි. ප්‍රේමය යන වචනයෙන් ප්‍රකාශ වන ප්‍රේමයේ ලක්ෂණ කොතෙක්ද යන්න පිළිබඳව බයිබල් ඥානකාන්තිය තුළින් හඳුනාගෙන ඇත්තෙමු. එහිදී ප්‍රේමයේ ලක්ෂණ අතර 'අගපේ ' ප්‍රේමය දෙවියන් වහන්සේ කිසිදු ආපසු බලාපොරොත්තුවකින් තොරව, පරිත්‍යාගශීලී ප්‍රේමය ලෙස

හඳුනා ගතිමු. මෙලොව ජීවිතයේදී සමිඳාණන් වහන්සේ ද පියාණන් වහන්සේගේ අගපේ ප්‍රේමයෙන් ජනතාවට ප්‍රේම කළ අතර උත්ථානයේ පසුවද තම හිතෛෂින්ට පමණක් නොව තමන් වහන්සේට එරෙහි වූවනට අගපේ ප්‍රේමයෙන්ම ප්‍රේම කරන සේක.

* අපට ප්‍රේම කරන අයෙකුට ප්‍රතිප්‍රේමය දැක්වීම අසීරු නොවේ. එහෙත් තමන්ට වචනයෙන්, ක්‍රියාවෙන් පමණක් සැමතින්ම එරෙහිව ක්‍රියා කරන්නෙකුට ප්‍රේමය දැක්වීම, විශේෂයෙන් 'අගපේ' ප්‍රේමයෙන් ප්‍රේම කිරීමක් කළ හැක්කේ කෙසේද? කිතු සමිඳුන් අගපේ ප්‍රේමයෙන් ප්‍රේම කිරීමට තෝරා ගත් අයෙකි ශු.පාවුළු තුමා.
* (මෙහෙයවන්නා දේව වචනය කලින් කියවා සූදානම් වන්න)
සාවුල් යනු අති ප්‍රබල ක්‍රිස්තු විරෝධියෙකි. ක්‍රියා 8:1-3, 9:1-2 ශු.ස්තේපන් තුමන්ට ගල් ගසා මරා දැමීමේ ක්‍රියාවෙහි පෙරමුණ ගත් අයෙකි සාවුල්. උත්ථානයෙන් පසු සමිඳුන් දර්ශණය වූයේ මෙලොව ජීවිතයේදී තමන් වහන්සේට ප්‍රේම කළ අය හටය. එහෙත් සාවුල්ට ඔවුන් වහන්සේ දර්ශණය වීම අදහාගත නොහැක්කකි. (ක්‍රියා 9:4-5) "සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන්දැ"යි කියන හඬක් ඔහුට ඇසිණි. "ස්වාමීනී ඔබ කවරෙක්දැ"යි ඔහු ඇසීය. "මම ඔබ පීඩා කරනු ලබන ජේසුස්ය" සාවුල් කිතුනුවන්ට කළ පීඩාව උත්ථානවූ සමිඳාණන් වහන්සේට දැනෙන තරම් ප්‍රබල විය. එහෙත් උත්ථානවූ සමිඳුන් හමුවූයේ එවැන්නෙකි.
* ක්‍රිස්තුන් වහන්සේගේ ඒ හමුව මහා ජීවිත පෙරළියකි. අදහාගත නොහැකි ජීවිත පරිණාමයකි. ක්‍රිස්තු විරෝධි සාවුල් ක්‍රිස්තුන් වහන්සේගේ නිමක් නැති ප්‍රේමයේ උරුමකරුවෙකි. ඔහුගේ දැක්ම වෙනස් විය. (ක්‍රියා 9:18) ඔහුගේ ජීවිත පැවැත්ම වෙනස් විය. (ක්‍රියා 9:15) භාරගනු ලැබූ ශුද්ධාත්ම කාර්ය භාරයකි. (ක්‍රියා 13:8) පැවරුන දූත කාර්ය භාර ගන්නේ අන් සැම මචිත කරවමිනි. (ක්‍රියා 13:8-12)
* ශු.පාවුළු තුමන් උත්ථානවූ සමිඳුන් හමුවීමේ ප්‍රතිඵලය වූයේ පැමිණි සෑම දුක් වේදනාවක් ප්‍රීතියෙන් හා සතුටින් බාර ගනිමින් නොපසුබට දූත කාර්යයයේ යෙදීමය. සිරගතවූ වාර බොහෝය. කසපහර කෑම්, වද වේදනාවට ලක් වූ වාර අපමණය. මේ හේතුව නිසාම සමිඳුන් ඔහුට දානය කළ තිළිණයක් වූයේ "කිසිවෙක් මට කරදර නොකෙරේවා. මන්ද මම මාගේ ශරීරයේ ජේසුස් වහන්සේගේ නිවරණ දරමි.(ගලාති 6:17) යනුවෙන් සමිඳාණන්ගේ නාමය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයට සූදානම් වීමය. (ශු.පාවුළු තුමා උත්ථාන වූ සමිඳුන් හමු වූ පසු අත්දුටු දේ කුඩා කණ්ඩායම් තුළ සාංඝික කර ගන්න.)

04. සතිය පුරා :

* ක්‍රියා පොතේ 22 හා 23 පරිච්ඡේද සම්පූර්ණයෙන් කියවන්න. උත්ථාන වූ ජේසු සමිඳුන් සාවුල්ව ශු.පාවුළු තුමන් හැටියට කිතුනු පුරෝගාමියෙකු හැටියට පත් කළ අයුරු නිතර නිතර මෙනෙහි කරන්න.
* ඔබ ලබන අත්දැකීම හැකිනම් පස් දෙනෙකුගේ කණ්ඩායම් තුළ අවම වශයෙන් තවත් කෙනෙකු සමඟ සාංඝික කර ගන්න.

05. අවසන් ප්‍රශංසාව - පුබුදු ගී අංක 121 "විජය ශ්‍රී ජේසු ක්‍රිස්තු ..."

********************